සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

පරිසර අමාත්‍යාංශය

පුරප්පාඩු

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රැකියා විස්තරය :

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.

01. සහකාර/නියෝජ්‍ය කළමනාකරු (පළාත්) (MM 1-1) - තනතුරු 01

පුරප්පාඩු පවතින පළාත - දකුණ

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධිවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය/ පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ කෘෂි විද්‍යාව/ව්‍යාහාරික විද්‍යාව/ජීව විද්‍යාව / සත්ව විද්‍යාව සහ ධිවර කටයුතු/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස:

අවු : 22 ට නොඅඩු හා අවු : 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

MM 1-1 - 2025 - (රු.91,690-10x2,480-15x3,450-168,240/=)

02. ලේකම් (MA 2-2) - තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - කොළඹ

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන්

ලේකම් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්

පරිගණක වදන් සැකසුම් / යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

වයස:

අවු : 18ට නොඅඩු හා අවු : 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

MA 2-2 - 2025 – (රු.50,540 - 10x540 - 7x630 - 4 x 1,080- 20x1,280-90,270/=)

03. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-2) - තනතුරු 04

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක - කොළඹ, ගම්පහ

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 04 කට සම්මාන සාමාර්ථද ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථද ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක්ද සහිතව විෂයයන් හය (06) කින් සමත් ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

වෙනත් සුදුසුකම්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද මාස 06කට නොඅඩු පරිගණක පිළිබඳ සහිතක පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

වයස:

අවු : 18 ට නොඅඩු හා අවු : 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

MA 1-2 - 2025 – (රු.46,220-10x540-7x630-12x1,080-12x1,280- 84,350/=)

04. රියදුරු (PL 3) - තනතුරු 02

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක - කොළඹ

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපන

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හය (06) කින් සමත් විම.

ප්‍රවීණතා

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස:

අවු : 18 ට නොඅඩු හා අවු : 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

PL3 - 2025 – (රු.43,280-10x490-10x540-10x590-12x630- 67,040/=)

05. සමුද්‍ර දූෂණය වැළැක්වීමේ ක්ෂේත්‍ර සහකාර (PL 2) - තනතුරු 04

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක - ත්‍රිකුණාමලය, යාපනය, ගම්පහ

සුදුසුකම්:

බාහිර අයදුම්කරුවන්

සිංහල / දෙමළ භාෂාව ඇතුළත්ව සම්මාන සාමාර්ථ 03ක් සහිතව විෂයයන් 06කින් අ.පොස. සාමාන්‍ය පෙළ සමත් විම.

හෝ

තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)

1. සිංහල / දෙමළ භාෂාව ඇතුළත්ව සම්මාන සාමාර්ථ 03ක් සහිතව විෂයයන් 06කින් අ.පොස. සාමාන්‍ය පෙළ සමත් විම.
2. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යුලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන, වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.
3. තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අමතර සුදුසුකම්

1. කිමිදීමට/ බෝට්ටු හා ඔරුපැදීමට ඇති හැකියාව.
2. පිහිනීමට හැකියාව තිබිය යුතුය.

වයස:

අවු : 18 ට නොඅඩු හා අවු : 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

PL2 - 2025 – (රු. 42,300-10x490-10x540-10x590-12x630 -66,060/=)

පොදු:

01. සෑම අයදුම්කරුවෙකුම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් ඉහවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

02. සුදුසුකම් ලබන දිනය:

සේවයට/තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

03.පත්වීමේ ස්වභාවය:

තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක් ලබා දෙනු ලැබේ.

අයදුම්පතු භාර්ම:

i. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිල වේබ් අඩවියෙන් (**https://mepa.gov.lk**) භාගත කර ගන්නා ලද ආදර්ශ අයදුම්පතුය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කළ යුතුය.

ii. තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

iii. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්, ග්‍රාම නිලධාරි සහතිකය, පොලිස් වාර්තාව, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා සම්පූර්ණ කළ අයදුම්පත් **2026.11.26** වෙනිදාට හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පතුය බහාලුම කවරයේ ඉහල වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

iv. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

v. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය,
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

2026.11.13